# නිපුණතා පාදක විෂය නිර්දේශය

## මූලික පිරිවෙණ

**(01 -05 ශ්‍රේණි)**

# संस्कृत

**(2017 සිට ක්‍රියාත්මක වේ)**

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

**සංස්කෘත**

**01 – 05 ශ්‍රේණි**

**නිපුණතා පාදක විෂය නිර්දේශය මූලික පිරිවෙණ**

**ප්‍රථම මුද්‍රණය 2016**

**පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,**

**අධ්‍යාපන අමාත්‍යාංශය,**

**ඉසුරුපාය, බත්තරමුල්ල.**

වෙබ් අඩවිය : www.pirivena.sch.lk

විද්‍යුත් තැපෑල : pirivena@moe.gov.lk

මුද්‍රණය : හෝමාගම, කටුවාන පාර, කාර්මික ජනපදය, 145 දරණ ස්ථානයෙහි පිහිටි සචින්ද ග්‍රැෆික් සිස්ටම්ස් (පුද්ගලික) සමාගමෙහි මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදී.

# පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ නාහිමිපාණන්ගේ පණිවුඩය

ලෝකයේ දියුණු නොදියුණු සෑම රටක ම කලින් කලට අධ්‍යාපනයට අදාළ නව විෂය නිර්දේශ හඳුන්වා දීම හෝ පවත්නා විෂය නිර්දේශ සංස්කරණය කිරීම කරනු ලබයි. මෙමගින් විෂය නිර්දේශයේ අන්තර්ගතය කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සකස්කර ගැනීමටත් විෂය නිර්දේශය නව ආකෘතියකින් ඉදිරිපත් කිරීම මගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් පහසු හා සාර්ථක කරගන්නටත් අවස්ථාව සැලසේ.

අනූව දශකයේ දී ජාතික අරමුණු නවයක් හා පොදු නිපුණතා පහක් සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කොට ගෙන විෂය නිර්දේශ ප්‍රතිසංස්කරණය කරණු ලැබිණි. මෙම සහශ්‍රයේ විෂය නිර්දේශ සකස් කිරීමේ දී යොදා ගන්නා ලද්දේ නිපුණතා පාදක ක්‍රමය යි. මෙම ක්‍රමය පාසල් අධ්‍යාපනයට හඳුන්වා දී දැනට වසර කීපයක් ම ගත වී හමාර ය. ඒ අනුව නවීන අධ්‍යාපන ක්‍රමවේදයක් වන නිපුණතා පාදක ඉගැන්වීම් ක්‍රමය පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට ද හඳුන්වා දීම අපේ අරමුණයි. පහත දැක්වෙන්නේ නිපුණතා පාදක ක්‍රමය පිළිබඳ පිළිගත් විග්‍රහයකි.

කිසියම් විෂය ක්ෂේත්‍රයකට අදාළ අත්‍යවශ්‍ය විෂය කරුණු, මූලධර්ම හා ක්‍රමශිල්ප ප්‍රායෝගික ආකාරයෙන් සුසංයෝගී ලෙස යොදා ගැනීමේ හැකියාව නිපුණතාව යි.

(අධ්‍යාපන විශ්වකෝෂය)

සැකෙවින් කිවහොත් නිපුණතාවක් යනු දැනුම, ආකල්ප, කුසලතා හා අන්තර් පුද්ගල හැකියා ඒකරාශී වී ගොඩනැගෙන ජීවිත පුරුද්දකි. ධනාත්මක ජීවිත පුරුදු ඇති කිරීම නිපුණතා පාදක විෂය නිර්දේශයක අරමුණයි.

නිවැරැදි පැහැදිලි හා විධිමත් විෂය නිර්දේශයක් ගුරුවරයාටත් ශිෂ්‍යයාටත් එකසේ වැදගත් වෙයි. විෂය නිර්දේශයෙන් පෙන්වා දෙන මාර්ගයේ ශිෂ්‍යයා කැඳවා ගෙන යාම ගුරුවරයාගේ කාර්යය යි. එම ගමන නිමා විය යුත්තේ ශිෂ්‍යයා විසින් ඉගෙනුම් පල අත්පත් කර ගැනීමෙනි. එවිට ශිෂ්‍යයාට මෙන් ම ගුරුවරයාට ද ඉගෙනුම් පල දැකීමෙන් සතුටට පත්විය හැකි ය.

කලකට පෙර පිරිවෙන් අධ්‍යාපනයට ම ආවේණික වූ විෂය නිර්දේශයක් විය. එහෙත් කාලයත් සමග පිරිවෙන් විෂය නිර්දේශය පාසල් විෂය නිර්දේශය තුළ නිමග්න වී ඇතුවා සේ ය. මේ නිසා ගිහි ශිෂ්‍යයාගේ අරමුණු හා ආකල්ප පැවිදි ශිෂ්‍යයාට ද නිරායාසයෙන් උරුම වෙමින් පවතී. ඒ හේතුවෙන් පැවිදි ශිෂ්‍යයා තමන්ට අදාළ ඉලක්ක වෙනුවට ගිහි ශිෂ්‍යයාගේ ඉලක්ක කරා ගමන් කිරීමෙන් ගමන නිමා වන බවක් දක්නට ලැබෙයි. මේ තත්ත්වය මත පාසල් අධ්‍යාපනයට අදාළ වූ විෂයයක් වුව ද පිරිවෙණේ ඉගැන්විය යුත්තේ පැවිද්දාට අදාළ ආකල්ප හා කුසලතා වර්ධනය කරවන පිරිවෙණට ම ආවේණික විෂය නිර්දේශයක් ඔස්සේ ය.

මේතාක් ලෝකයේ අධ්‍යාපන අරමුණු ප්‍රධාන වශයෙන් ඉලක්ක ගත වී පැවතියේ භෞතික දියුණුව සාර්ථක කර ගනු පිණිස ය. එහෙත් දියුණු ලෝකයේ රටවල් මේ වන විටත් එහි අනිසි විපාක අත්විඳිමින් සිටින බැවින් අනාගත ලෝකයේ අධ්‍යාපනික අරමුණු සකස් වෙමින් පවත්නේ භෞතික දියුණුව මෙන් ම ආධ්‍යාත්මික ශික්ෂණය ද අරමුණු කොට ගෙන ය. එබැවින් පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශ මගින් එකී අවශ්‍යතාව ඉටු කර ගැනීම අපගේ අරමුණ යි.

**මහාචාර්ය නාබිරිත්තන්කඩවර ඥාණරතන හිමි**

අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)

2016.12.14

## අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාව තුළ බුද්ධ ධර්මය ස්ථාපිත වීමත් සමග ම විහාරාරාම ගොඩනැංවීම ආරම්භ විය. දිවයිනේ ප්‍රධාන විහාරස්ථාන කේන්ද්‍ර කර ගනිමින් "පිරිවෙණ" නමැති විද්‍යායතනය බිහි විය. පැවිදි ගිහි දෙපක්ෂයට ම අවශ්‍ය වූ කලා ශිල්ප, භාෂා හා සමය සමයාන්තර ඥානයත්, යහපත්, ගුණගරුක සමාජයක් බිහි කිරීමට අවශ්‍ය සාරධර්ම අධ්‍යාපනයත් බෙදා දුන්නේ පිරිවෙණ මගිනි. සාම්ප්‍රදායික අනන්‍යතාව රැක ගනිමින් ම, කාලීන අවශ්‍යතා ද සපුරාලමින් යහපත් සමාජයක් ගොඩනැගීමේ කාර්යය ඉදිරියට ගෙන යාමට පිරිවෙණ ඉටු කරන කාර්යභාරය සුළු කොට තැකිය නොහැකි ය.

පිරිවෙණේ අධ්‍යාපනය ලබන පැවිදි ගිහි සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී කිරීමට සහ පරිවේණාචාර්යවරුන්ගේ ඉගැන්වීම් ක්‍රියාවලිය ගුණාත්මක ව සංවර්ධනය කිරීමට 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව විෂය නිර්දේශ මුද්‍රණය කර ප්‍රථම වරට ලබා දීමට හැකිවීම ඉමහත් සතුටකි.

**අයි.එම්.කේ.බී. ඉලංගසිංහ**

අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,

ඉසුරුපාය,

බත්තරමුල්ල.

2016.12.14

## විෂය නිර්දේශ කමිටුව

උපදේශකත්වය හා අනුමැතිය - මහාචාර්ය, පූජ්‍ය නාබිරිත්තන්කඩවර ඥාණරතන හිමි,
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්),
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය.

විෂය විශේෂඥ උපදේශනය - පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි,
මහාචාර්ය, සංස්කෘත අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

විෂය සම්බන්ධීකරණය - පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි,
සංස්කෘත විෂය උපදේශක (පිරිවෙන්),
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය.

ලේඛක මණ්ඩල

01. පූජ්‍ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි,
(රාජකීය පණ්ඩිත, ආචාර්ය)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය,
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය,
කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.

02. පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි,
(රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, (විශිෂ්ට පන්ති)
පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා, (විශිෂ්ට පන්ති)
පශ්චාද් උපාධි උපදේශන ඩිප්ලෝමා, (විශිෂ්ට පන්ති)
අධ්‍යාපනපති, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, (අංශ ප්‍රධාන)
සම්භාව්‍ය හා විදේශ භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

03. පූජ්‍ය උඩවෙල රේවත හිමි,
(රාජකීය පණ්ඩිත, දර්ශනපති)
කථිකාචාර්ය, සංස්කෘත අධ්‍යයන අංශය,
කැලණිය විශ්ව විද්‍යාලය.

04. පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි,
සංස්කෘත විෂය උපදේශක (පිරිවෙන්),
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය.

05. පූජ්‍ය රුපහ ඥාණරතන හිමි,
(රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති)
සංස්කෘත විෂය භාර ආචාර්ය,
ගම්/ශාසනවර්ධන මූලික පිරිවෙණ, මීරිගම.

06. පූජ්‍ය මල්අස්නේ තිලකවංශ හිමි,
(රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති)
සංස්කෘත ගුරු උපදේශක,
ගම්/ශ්‍රී සුමංගල මහ පිරිවෙණ,
වලලියද්ද, එල්ලක්කල.

07. පූජ්‍ය අබේසේකරගම විජිත හිමි,
(රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති)
පරිවෙණාධිපති, සංස්කෘත විෂය භාර ආචාර්ය,
ගා/ශ්‍රී රේවත මහ පිරිවෙණ, කුඹල්වැල්ල, ගාල්ල.

08. කේ. බී. ජයවර්ධන මහතා,
(රාජකීය පණ්ඩිත, ආචාර්ය)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංස්කෘත අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

09. ඒ. කේ. එච්. ධර්මප්‍රිය මහතා,
(රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය,
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය,
කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.

10. ඩී. ජී. සුනිල් මහතා,
(රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති)
සංස්කෘත විෂය භාර ආචාර්ය,
ගා/ ශ්‍රී විජයානන්ද මූලික පිරිවෙණ, හබරකඩ, තවලම.

11. නදී අමා ජයසේකර
(අධ්‍යාපනවේදී, අධ්‍යාපනපති),
ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ,
ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

12. ඩී. එම්. ජේ. පුෂ්පකුමාර මහතා,
සහකාර කොමසාරිස්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය, බත්තරමුල්ල.

විෂය සංස්කරණය

පූජ්‍ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි,
(රාජකීය පණ්ඩිත, ආචාර්ය)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය,
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය,
කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.

පරිගණක වදන් සැකසුම

01. පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි,
සංස්කෘත විෂය උපදේශක (පිරිවෙන්),
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය.

02. නදී අමා ජයසේකර,
ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ,
ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

පිටකවර නිර්මාණය

පී. ඒ. ශයිනි ඉමල්ෂා විජේවර්ධන,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

## විෂය අධ්‍යයනයේ අරමුණු

01 සිංහල හා සංස්කෘත වර්ණ මාලාව පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයකට පෙළඹවීමක් ලැබීම

02 සිංහල භාෂාව නිවැරදි ව භාවිත කිරීමට මූලාධාර වීම

03 ආයුර්වේදය, ජ්‍යොතිර්විද්‍යාව, නක්ෂත්‍රශාස්ත්‍රය වැනි විවිධ ශාස්ත්‍ර, කලා ශිල්ප හා දර්ශනවාද ඉගැනීමේ දී ජීවභාෂාවක් වශයෙන් දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනයට ශක්තිමත් පදනමක් සැපයීම

04 ඉන්දියානු භාෂා අධ්‍යයනයට අත්වැලක් සැපයීම

05 පුරාණ ඥාන ගවේෂණය සඳහා උපකාරී වීම

06 වාග්විද්‍යාත්මක භාෂා ගවේෂණයට හා පාරිභාෂික ශබ්දමාලා සම්පාදනයට මූලාධාර වීම

07 සාහිත්‍ය රසාස්වාදයට රුකුලක් වීම

08 හරධර්ම චරිතායනයට සහාය වීම

09 තොරතුරු තාක්ෂණය සඳහා විධිමත් භාෂා මාධ්‍යයක් ගොඩනැගීමට මූලාධාර වීම

10 විශ්වීය කේත (Universal code) ක්‍රමයකට අවශ්‍ය විද්‍යාත්මක භාෂා අධ්‍යයනය සඳහා රුකුලක් වීම

11 හින්දු ස්තෝත්‍ර හා බෞද්ධ සංස්කෘත ශ්ලෝක, සංස්කෘත භාෂාවෙන් ලියැ වී ඇති බැවින් ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සමගියට අවශ්‍ය දායකත්වය ලබාදීම

12 ලෞකික සංස්කෘත සාහිත්‍යය හා බෞද්ධ සංස්කෘත සාහිත්‍යය අධ්‍යයනය කිරීමෙන් උභයාර්ථ සංසිද්ධිය ඇති කරලීම සඳහා මහා රුකුලක් වීම

## විෂය හැඳින්වීම

ලෝකයේ ප්‍රචලිත ව පැවැති හා පවතින සියලු භාෂා ඇතැමුන් විසින් ජීවභාෂා, මෘත භාෂා හා සම්භාව්‍ය භාෂා යනුවෙන් වර්ගත්‍රයකට බෙදා-දක්වනු ලැබේ. ජීවභාෂා යනු අද්‍යතන ව්‍යවහාරයේ පවතින සිංහල, දෙමළ, ඉංග්‍රීසි, ජර්මන්, ජපන් ආදි භාෂාවෝ ය. මෘතභාෂා හෙවත් මළබස් යනු කලින් ව්‍යවහාරයේ පැවැත, අද ව්‍යවහාරයෙන් ගිලිහී-ගොස් ඇති භාෂා ය. මධ්‍යතන ප්‍රාකෘත භාෂා වූ ශෞරසේනී, අපභ්‍රංශ, ආවන්තී, ප්‍රාච්‍යා ආදිය උදාහරණ ය. බහුතර ජනයා විසින් ව්‍යවහාර නො කරනු ලබන භාෂා වුව ද, ආගමික හා ශාස්ත්‍රීය අගයකින් යුත් ලතින්, සංස්කෘත හා පාලි වැනි භාෂාවෝ සම්භාව්‍ය භාෂා ගණයට අයත් වෙති.

ලෝකයේ පවත්නා සම්භාව්‍ය භාෂා අතුරින් සංස්කෘතයට හිමි වන්නේ අද්විතීය ස්ථානයෙකි. යුරෝපයේ හා ආසියාවේ ප්‍රචලිත ග්‍රීක හා ලතින් ඇතුළු භාෂා බහුතරයෙක මූල භාෂාව ලෙස සැලැකෙන්නේ සංස්කෘතය යි. එය ඉතා පොහොසත් වාක්කෝෂයකින් හා අතිශයින් සංකීර්ණ ව්‍යාකරණයකින් ද සමන්විත අතිප්‍රබල පෞරුෂයක් දනවන භාෂාවෙකි. ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් උරුම කොට ඇති එය සංගීතය, නර්තනය, නාට්‍යය, චිත්‍ර කලාව, මූර්ති ශිල්පය වැනි පෙරදිග කලා මෙන් ම කාව්‍යශාස්ත්‍රය, වෛද්‍යවිද්‍යාව, පුරාවිද්‍යාව, ආයුර්වේදය, ජ්‍යෝතිශ්ශාස්ත්‍රය වැනි ශාස්ත්‍රීය විෂය සමඟ ද අත්‍යන්තයෙන් බැඳී-පවතින්නකි. සිංහලය හා සියලු උත්තර භාරතීය භාෂා හදාරන විද්‍යාර්ථීනට සංස්කෘතය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබීම ඉතා ප්‍රයෝජනවත් ය. අද ප්‍රචලිත හින්දි, ගුජරාටි, මරාටි ආදි සියලු භාරතීය භාෂා දොඩන්නවුනට වඩා සංස්කෘත වචන නිවැරැදි ව උච්චාරණය කළ හැක්කේ සිංහල භාෂකයනට ය. සිංහල වාක්කෝෂයෙන් සියයට අනූවක් ම සමන්විත ව ඇත්තේ තත්සම ස්වරූපයෙන් භාවිත වන සංස්කෘත වචන හා ඒවායින් බිඳී ආ තද්භව රූපවලිනි. සංස්කෘතයේ ආධිපත්‍යයට යට වී තිබුණු සිංහලය ඉන් මුදා ගැනීමට ප්‍රබල සටනක් ගෙන ගිය කුමාරතුංග මුනිදාසයන් සිංහල ගුරුවරුනට දුන් මුඛ්‍ය උපදේශය නම්, ඔවුන් විසින් පුරාණ භාෂාවක් වශයෙන් සංස්කෘතය අනිවාර්යයෙන් උගත යුතු බව යි. සෙනරත් පරණවිතාන, ආනන්ද කුමාරස්වාමි ආදීන් ලෝ පතළ උගතුන් බවට පත් වූයේ, ඔවුන් සතු ව තිබූ සංස්කෘත ඥානය නිසා බව අප අමතක නො කළ යුතු ය.

මේ අනුව සංස්කෘතය මළ බසෙකැ යි කියමින් එ බස ඉගැනීම නිෂ්ඵල ව්‍යායාමයෙකැ යි පවසන්නන් අඥානයන් බව පිළිගැනීමට සිදු වෙයි. සංස්කෘතය කිසි ලෙසෙකිනුත් මළ බසෙක් නො වේ. තව මත් සංස්කෘතයෙන් ග්‍රන්ථ රචනා වෙමින් පවතින අතර, එය මවුබස ලෙස වහරන සුළු පිරිසක් හෝ අද ද භාරතයේ වාසය කරති. ලෝකයේ උසස් යැ යි සම්මත විද්‍යා නිකේතන වන ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ්, හාර්වර්ඩ්, චිකාගෝ, ජර්මනියේ ගොටින්ජන්, ඕස්ත්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයය ආදියෙහි සංස්කෘතය සම්භාව්‍ය භාෂාවක් වශයෙන් ඉගැන්වේ. සංස්කෘත භාෂා අධ්‍යයනය අන් කිසිවකුටත් වඩා වැදගත් වනුයේ ශ්‍රී ලාංකිකයන් වන අපට ය. එ බස හදාරන්නා, මනා පෞරුෂයකින් හෙබි, සදාචාර සම්පන්න, පරිපූර්ණ මිනිසකු බවට පත් කිරීමේ ශක්තිය සංස්කෘතය සතු ව ඇත.

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි
සංස්කෘත විෂය උපදේශක (පිරිවෙන්),
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය.

# වර්ෂයකට යෝජිත කාලච්ඡේද

| ශ්‍රේණිය / නිපුණතාව | | 1 ශ්‍රේණිය | 2 ශ්‍රේණිය | 3 ශ්‍රේණිය | 4 ශ්‍රේණිය | 5 ශ්‍රේණිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| * දේවනාගරී අක්ෂර මාලාව නිවැරැදි ව භාවිත කරයි. | නිපුණතාව | 01 | 01 | 01 | 01 | 01 | |
| | කාලච්ඡේද | 40 | 25 | 15 | 15 | 15 | 110 |
| * සංස්කෘත භාෂාවේ නාම පද නිවැරැදි ව භාවිත කරයි. | නිපුණතාව | 02 | 02 | 02 | 02 | 02 | |
| | කාලච්ඡේද | 20 | 25 | 15 | 15 | 15 | 90 |
| * සංස්කෘත භාෂාවේ ආඛ්‍යාත පද නිවැරැදි ව භාවිත කරයි. | නිපුණතාව | 03 | 03 | 03 | 03 | 03 | |
| | කාලච්ඡේද | 20 | 30 | 15 | 15 | 15 | 95 |
| * සංස්කෘත භාෂාව නිවැරැදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍ය නිර්මාණය කරයි. | නිපුණතාව | 04 | 05 | 08 | 08 | 08 | |
| | කාලච්ඡේද | 40 | 30 | 15 | 10 | 10 | 105 |
| * නිර්දිෂ්ට ග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි. | නිපුණතාව | 05 | 06 | 09 | 09 | 09 | |
| | කාලච්ඡේද | 60 | 60 | 35 | 27 | 15 | 197 |
| * සංස්කෘත භාෂාවේ භාෂාවේ සන්ධි නිවැරැදි ව භාවිත කරයි. | නිපුණතාව | - | 04 | 04 | 04 | 04 | |
| | කාලච්ඡේද | - | 10 | 10 | 12 | 15 | 47 |
| * සංස්කෘත භාෂාවේ සමාස නිවැරැදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 05 | 05 | 05 | |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | 37 |
| * සංස්කෘත භාෂාවේ තද්ධිත නිවැරැදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 06 | 06 | 06 | |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | 37 |
| * සංස්කෘත භාෂාවේ කෘදන්ත නිවැරැදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 07 | 07 | 07 | |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | 37 |
| * උපදේශ සාහිත්‍යය හා මහාකාව්‍ය සාහිත්‍යය රසවිඳියි. | නිපුණතාව | - | - | 10 | 10 | 10 | |
| | කාලච්ඡේද | - | - | 40 | 45 | 45 | 130 |
| එකතුව | | 180 | 180 | 175 | 175 | 175 | 885 |

# संस्कृतपाठ्यक्रमः

සංස්කෘත විෂය නිර්දේශය

## 1 ශ්‍රේණිය

सर्वभाषासु या श्रेष्ठा  या चाढ्या शास्त्रसंचयैः ।
श्रेयं संस्कृतभाषा ते  भूयाद्वृद्ध्यै शिवाय च ॥

සියලු භාෂා අතර උතුම් වූ ද, ශාස්ත්‍ර සමූහයෙන් පොහොසත් වූ ද,

සංස්කෘත භාෂාව ඔබේ දියුණුව හා යහපත පිණිස වන්නේ ය.

# 1 ශ්‍රේණිය විෂය නිර්දේශය සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **1.0 දේවනාගරී අක්ෂරමාලාව නිවැරැදි ව භාවිත කරයි.** | 1.1 දේවනාගරී අක්ෂරමාලාව කියවයි, ලියයි. | 1.1 දේවනාගරී අක්ෂර<br>• ස්වරාක්ෂර 14<br>• ව්‍යඤ්ජනාක්ෂර 35<br>  • ව්‍යඤ්ජනාක්ෂරවලට ස්වරාරෝපණය වී ඇති ආකාරය | 1.1<br>• දේවනාගරී හෝඩිය හඬනගා කියවයි.<br>• සිංහල හෝඩියේ සහ දේවනාගරී හෝඩියේ උච්චාරණයෙහි ඇති වෙනස සංසන්දනය කරයි.<br>• සිංහල හෝඩියේ සහ දේවනාගරී හෝඩියේ අක්ෂර රූප සංසන්දනය කරයි.<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර කියවයි, ලියයි.<br>• දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර කියවයි, ලියයි.<br>• ව්‍යඤ්ජනාක්ෂරවලට ස්වරාක්ෂර එකතු වී ඇති ආකාරය වියුක්ත කර පෙන්වයි.<br>• ස්වරාරෝපණයේ දී ව්‍යඤ්ජනාක්ෂරවල ඇති වන විශේෂතා ඉස්මතු කර පෙන්වයි. | 40 |
| | 1.2 පිලි සහිත දේවනාගරී අක්ෂර සහ දේවනාගරී සංයුක්තාක්ෂර කියවයි, ලියයි. | 1.2 පිලි සහිත අක්ෂර<br>• සංයුක්තාක්ෂර | 1.2<br>• පිලි සහිත දේවනාගරී සංයුක්තාක්ෂර කියවයි, ලියයි. | |
| | 1.3 දේවනාගරී අක්ෂරවලින් සඳහන් ව්‍යවහාරයේ පවතින සරල සංස්කෘත වචන කියවයි, ලියයි. | 1.3 දේවනාගරී වචන<br>• සුලබ සංස්කෘත වචන | 1.3<br>• සංයුක්තාක්ෂර සහිත සරල වචන කියවයි, ලියයි. | |

# 1 ශ්‍රේණිය විෂය නිර්දේශය සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.4 දේවනාගරී ඉලක්කම් කියවයි, ලියයි. | 1.4 දේවනාගරී ඉලක්කම් | 1.4<br>• 0 සිට 10 දක්වා දේවනාගරී ඉලක්කම් රූප කියවයි, ලියයි.<br>• 0 සිට 10 දක්වා දේවනාගරී ඉලක්කම් භාවිත කරමින් 100 දක්වා සංඛ්‍යා ගොඩනගයි. | |
| **2.0 සංස්කෘත භාෂාවේ නාම පද නිවැරැදි ව භාවිත කරයි.** | 2.1 සංස්කෘත භාෂාවේ තෝරාගත් නාම, ඒක වචන, ද්වි වචන සහ බහු වචන ලෙස නිවැරැදි ව වර්ග කරයි. | 2.1 නාම පද<br>• නාම පදවල පවතින වචනත්‍රය<br>• ඒක වචන<br>• ද්වි වචන<br>• බහු වචන | 2.1<br>• මාතෘ භාෂාවේ එදිනෙදා භාවිත කරන නාම පද ප්‍රකාශ කරයි.<br>• මාතෘ භාෂාවේ එදිනෙදා භාවිත කරන නාම පද සංස්කෘත භාෂාවෙන් වාචික ව ප්‍රකාශ කරයි.<br>• මාතෘ භාෂාවේ ඇති නාම පද ඒක වචන සහ බහු වචන ලෙස වර්ග කිරීමත්, සංස්කෘත භාෂාවේ පවතින වචනත්‍රයත් සංසන්දනය කරයි.<br>• සංස්කෘත භාෂාවේ වචනත්‍රයට අනුව එදිනෙදා භාවිත කරන තෝරාගත් සංස්කෘත වචන වාචික ව වර්ග කර පෙන්වයි. | 20 |
| | 2.2 සංස්කෘත භාෂාවේ ලිඞ්ග භේදයට අනුකූල ව තෝරාගත් වචන වර්ග කරයි. | 2.2 ලිංග භේදය<br>• පුරුෂ<br>• ස්ත්‍රී<br>• නපුංසක | 2.2<br>• එදිනෙදා භාවිත කරන සංස්කෘත වචන පුරුෂ ලිඞ්ග, ස්ත්‍රී ලිඞ්ග සහ නපුංසක ලිඞ්ග වශයෙන් වාචික ව පෙළ ගස්වයි. | |
| | 2.3 නාමවල ශබ්ද මූලය වෙන් කරයි. | 2.3 නාමයක ශබ්ද මූලය | 2.3<br>• දෙනු ලබන නාම පදයක ශබ්ද මූලය ඉස්මතු කර පෙන්වයි. | |

# 1 ශ්‍රේණිය විෂය නිර්දේශය සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.4 නාමයක් ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවලට අනුව වරනගයි. | 2.4 විභක්ති<br>• ප්‍රථමා සහ ද්විතීයා<br>  • අකාරාන්ත පුරුෂ ලිඞ්ග සහ නපුංසක ලිඞ්ග ශබ්ද<br>  • ආකාරාන්ත ස්ත්‍රී ලිඞ්ග ශබ්ද | 2.4<br>• එදිනෙදා භාවිත කරන අකාරාන්ත පුරුෂ ලිඞ්ග සහ නපුංසක ලිඞ්ග නාම, ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවල වරනගයි.<br>• එදිනෙදා භාවිත කරන ආකාරාන්ත ස්ත්‍රී ලිඞ්ග නාම, ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවල වරනගයි. | |
| | 2.5 නාම පද අතර සර්ව නාම පද වෙන් කර පෙන්වයි. | 2.5 සර්ව නාම<br>• සර්ව නාම සරල ව හැඳින්වීම<br>• සර්ව නාම යෙදෙන අවස්ථා | 2.5 සර්ව නාම යනු මොනවා දැ යි නිදසුන් සහිත ව පහදයි. | |
| | 2.6 විභක්තිවලට අනුව නාම නිවැරදි ව වරනගයි. | 2.6 නාම විභක්ති සහ විභක්ති අර්ථ හඳුනාගැනීම<br>• ලිඞ්ගත්‍රයට අනුව ස්වරාන්ත නාම වරනැගීම සහ වාචෝද්ගත කිරීම<br>  • ස්වරාන්ත හතරක්<br>    • අකාරාන්ත<br>    • ආකාරාන්ත<br>    • ඉකාරාන්ත<br>    • උකාරාන්ත | 2.6<br>• නාම විභක්ති නම් කරයි.<br>• නාම විභක්තිවල අර්ථය පහදයි.<br>• ස්වරයකින් අවසන් වන නාම පද ස්වරාන්ත ලෙස නම් කරයි.<br>• දෙනු ලබන විවිධ ස්වරාන්ත නාම අකාරාන්ත, ආකාරාන්ත, ඉකාරාන්ත සහ උකාරාන්ත ලෙස පෙළ ගස්වයි.<br>• අකාරාන්ත පුරුෂ ලිඞ්ග 'කුමාර' ශබ්දය අනුපිළිවෙළට වරනගයි.<br>• ඉකාරාන්ත පුරුෂ ලිඞ්ග 'මුනි'ශබ්දය අනුපිළිවෙළට වරනගයි. | |

# 1 ශ්‍රේණිය විෂය නිර්දේශය  සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | | • උකාරාන්ත පුරුෂ ලිඞ්ග 'ගුරු' ශබ්දය අනුපිළිවෙළට වරනගයි.<br>• අකාරාන්ත නපුංසක ලිඞ්ග 'ඵල' ශබ්දය අනුපිළිවෙළට වරනගයි.<br>• ආකාරාන්ත ස්ත්‍රී ලිඞ්ග 'ලතා' ශබ්දය අනුපිළිවෙළට වරනගයි.<br>• අකාරාන්ත, ආකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත යන අන්ත අනුව නාම වරනැගීමේ දී දැකිය හැකි වෙනස්කම් පැහැදිලි කරයි.<br>• ලිඞ්ගත්‍රයට අනුව නාම වරනැගීමේ දී දැකිය හැකි වෙනස්කම් පැහැදිලි කරයි. | |

# 1 ශ්‍රේණිය විෂය නිර්දේශය සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | | • උකාරාන්ත පුරුෂ ලිඞ්ග 'ගුරු' ශබ්දය අනුපිළිවෙළට වරනගයි.<br>• අකාරාන්ත නපුංසක ලිඞ්ග 'ඵල' ශබ්දය අනුපිළිවෙළට වරනගයි.<br>• ආකාරාන්ත ස්ත්‍රී ලිඞ්ග 'ලතා' ශබ්දය අනුපිළිවෙළට වරනගයි.<br>• අකාරාන්ත, ආකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත යන අන්ත අනුව නාම වරනැගීමේ දී දැකිය හැකි වෙනස්කම් පැහැදිලි කරයි.<br>• ලිඞ්ගත්‍රයට අනුව නාම වරනැගීමේ දී දැකිය හැකි වෙනස්කම් පැහැදිලි කරයි. | |
| 3.0 සංස්කෘත භාෂාවේ ආඛ්‍යාත පද (අවසාන ක්‍රියා පද) නිවැරැදි ව භාවිත කරයි. | 3.1 ආඛ්‍යාතවල ධාතු මූලය වෙන් කරයි. | 3.1 ආඛ්‍යාත පදයක (අවසාන ක්‍රියා පදයක) ධාතු මූලය | 3.1<br>• දෙනු ලබන ආඛ්‍යාත පදයක (අවසාන ක්‍රියා පදයක) ධාතු මූලය ඉස්මතු කර පෙන්වයි. | 20 |
| | 3.2 ලට්, ලඞ් පරස්මෛපද ප්‍රත්‍යය සහිත ආඛ්‍යාත පද (අවසාන ක්‍රියා පද) නම් කරයි. | 3.2 ලට්, ලඞ් පරස්මෛපද ප්‍රත්‍යය<br>• හඳුනා ගැනීම<br>• වාචෝද්ගත කිරීම | 3.2<br>• දෙනු ලබන ආඛ්‍යාත පදවලට අදාළ ධාතු මූලය සහ ලට්, ලඞ් පරස්මෛ පද ප්‍රත්‍යය වියුක්ත කර දක්වයි.<br>• ලට්, ලඞ් පරස්මෛපද ප්‍රත්‍යය අදාළ අනුපිළිවෙළට වාචෝද්ගත ව ඉදිරිපත් කරයි. | |

# 1 ශ්‍රේණිය විෂය නිර්දේශය සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **4.0 සංස්කෘත භාෂාව නිවැරැදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍ය නිර්මාණය කරයි.** | 4.1 උක්තය සහ ආඛ්‍යාතය පමණක් ඇති සරල වාක්‍ය ගොඩනගයි. | 4.1 උක්තය සහ ආඛ්‍යාතය පමණක් ඇති සරල වාක්‍ය<br>• උක්තය (නාම)<br>• ආඛ්‍යාතය (ක්‍රියා) | 4.1<br>• උක්තය සහ ආඛ්‍යාතය පමණක් ඇති සරල වාක්‍ය ලියයි. | 40 |
| | 4.2 පුරුෂ භේදය සහ වචන භේදය සැලැකිල්ලට ගනිමින් සරල වාක්‍ය ගොඩනගයි. | 4.2 පුරුෂ භේදය සහ වචන භේදය<br>• ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ, උත්තම පුරුෂ<br>• ඒක වචන, ද්වි වචන, බහු වචන<br><br>* 'බාලාදර්ශයේ' 1 සිට 15 දක්වා පාඩම් යොදාගනිමින් ඉහත විෂය කොටස් ආවරණය කිරීම අපේක්ෂා කෙරේ. | 4.2<br>• ලියනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතය ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ සහ උත්තම පුරුෂ ලෙස කාණ්ඩ කරයි.<br>• ආඛ්‍යාතය ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ හෝ උත්තම පුරුෂ ලෙස ලිවීමට පවරනු ලැබූ විට අදාළ සරල වාක්‍යයක් නිවැරැදි ව ගොඩනගයි.<br>• වාක්‍යවල ආඛ්‍යාතය ඒක වචන, ද්වි වචන, බහු වචන ලෙස වර්ග කර පෙන්වයි.<br>• ඒක වචන, ද්වි වචන, බහු වචන ආඛ්‍යාතය සහිත සරල වාක්‍ය ලියයි. | |

# 1 ශ්‍රේණිය විෂය නිර්දේශය සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **5.0 නිර්දිෂ්ට ග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.** | 5.1 නිර්දිෂ්ට ග්‍රන්ථවල ශ්ලෝක වාචෝද්ගත කරයි, දේවනාගරී අක්‍ෂරවලින් ද, සිංහල අක්‍ෂරවලින් ද, ලියයි. | 5.1 බුද්ධගද්‍යය (බුද්ධ පද්‍යය), බාලාදර්ශය සහ සංස්කෘත පාඨමාලා 01<br>• බුද්ධගද්‍යය (බුද්ධ පද්‍යය) ශ්ලෝක 41<br>• බාලාදර්ශය 30 වැනි පාඩම - උපදේශමාලා<br>• සංස්කෘත පාඨමාලා 01<br>• (නිර්දිෂ්ට පාඨ වණපොත් කිරීම අපේක්‍ෂා කෙරේ.) | 5.1<br>• බුද්ධගද්‍යයේ (බුද්ධ පද්‍යයේ) ශ්ලෝක කටපාඩමින් කියයි.<br>• බාලාදර්ශයේ 30 වැනි පාඩමෙහි එන උපදේශමාලා ශ්ලෝක කටපාඩමින් කියයි.<br>• බුද්ධගද්‍යයේ (බුද්ධ පද්‍යයේ) ශ්ලෝක සිංහල අක්‍ෂරවලින් ලියයි.<br>• බුද්ධගද්‍යයේ (බුද්ධ පද්‍යයේ) ශ්ලෝක දේවනාගරී අක්‍ෂරවලින් ලියයි.<br>• බාලාදර්ශය 30 වැනි පාඩම දේවනාගරී අක්‍ෂරවලින් ලියයි.<br>• බාලාදර්ශය 30 වැනි පාඩම සිංහල අක්‍ෂරවලින් ලියයි.<br>• සංස්කෘත පාඨමාලා 01 අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි. | 60 |

# නිර්දිෂ්ට ග්‍රන්ථ හා පරිශීලනීය ග්‍රන්ථ (1 ශ්‍රේණිය)

## 1. නිර්දිෂ්ට ග්‍රන්ථ

- සංස්කෘත භාෂාව - 01 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- බුද්ධගද්‍යය (බුද්ධ පද්‍යය) - සම්පූර්ණ පොත
- සංස්කෘත බාලාදර්ශය (30 පාඩම), විද්‍යාසාගර කේ. එල්. වී. ශාස්ත්‍රී, ආර්. එස්. වෛද්‍යාර් සහ පුත්‍රයෝ, ඉන්දියාව, 2007
- සංස්කෘත පාඨමාලා - 01, පූජ්‍ය බෝදාවල පියභාරති හිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන, 2016
- සංස්කෘත අකුරු ලියමු - (01) ප්‍රාචී ප්‍රකාශන.

## 2. පරිශීලනීය ග්‍රන්ථ

- සරල සංස්කෘත ශික්ෂකය - 01, බලන්ගොඩ ආනන්ද මෛත්‍රේය මහ නාහිමි, මොඩන් පොත් සමාගම, නුගේගොඩ, 2012

# संस्कृतपाठ्यक्रमः

සංස්කෘත විෂය නිර්දේශය

## 2 ශ්‍රේණිය

**गु शब्दस्त्वन्धकारः स्यात्  रु शब्दस्तन्निरोधकः ।**
**अन्धकार निरोधित्वात्  गुरुरित्यभिधीयते ॥**

'ගු' ශබ්දයෙන් අන්ධකාරය කියැවෙයි, 'රු' ශබ්දයෙන් ඒ අන්ධකාරය දුරු කිරීම කියැවෙයි,

('නො දැනීම') නමැති අඳුර දුරු කරන හෙයින් 'ගුරු' යැ යි කියනු ලැබේ.

# 2 ශ්‍රේණිය විෂය නිර්දේශය සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **1.0** දේවනාගරී අක්ෂරමාලාව නිවැරැදි ව භාවිත කරයි. | 1.1 දේවනාගරී අක්ෂරමාලාවේ ස්වරාක්ෂර සහ ව්‍යඤ්ජනාක්ෂර වර්ගීකරණය කරයි. | 1.1 ස්වර ප්‍රභේද සහ ව්‍යඤ්ජන ප්‍රභේද<br>• ස්වර ප්‍රභේද<br>  • හ්‍රස්ව අක්ෂර<br>  • දීර්ඝ අක්ෂර<br>  • සන්ධ්‍යක්ෂර<br>• ව්‍යඤ්ජන ප්‍රභේද<br>  • අල්පප්‍රාණ<br>  • මහාප්‍රාණ<br>  • අන්තඃස්ථ<br>  • අනුස්වාර<br>  • ඌෂ්මාක්ෂර<br>  • විසර්ග | 1.1<br>• දේවනාගරී හෝඩිය භාවිත කරමින් එදිනෙදා පරිහරණය කරන සංස්කෘත වචන නිවැරැදි ව ලියයි.<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂරවල හ්‍රස්ව, දීර්ඝ සහ සන්ධ්‍යක්ෂර යනුවෙන් ප්‍රභේද තුනක් ඇති බව ප්‍රකාශ කරයි.<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර හ්‍රස්ව, දීර්ඝ සහ සන්ධ්‍යක්ෂර යන ප්‍රභේද තුනට වෙන් කර ලියයි.<br>• හ්‍රස්ව, දීර්ඝ සහ සන්ධ්‍යක්ෂර යන ප්‍රභේද තුනට අයත් ස්වරාක්ෂර සහිත වචන කියවයි, ලියයි.<br>• දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂරවල අල්පප්‍රාණ, මහාප්‍රාණ, අන්තඃස්ථ, අනුස්වාර, ඌෂ්මාක්ෂර, විසර්ග යනුවෙන් ප්‍රභේද හයක් ඇති බව ප්‍රකාශ කරයි.<br>• දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර අල්පප්‍රාණ, මහාප්‍රාණ, අන්තඃස්ථ, අනුස්වාර, ඌෂ්මාක්ෂර, විසර්ග යන ප්‍රභේද හයට වෙන් කර ලියයි.<br>• අල්පප්‍රාණ, මහාප්‍රාණ, අන්තඃස්ථ, අනුස්වාර, ඌෂ්මාක්ෂර, විසර්ග යන ප්‍රභේද හයට අයත් ව්‍යඤ්ජනාක්ෂර සහිත වචන කියවයි, ලියයි. | 25 |
| **2.0** සංස්කෘත භාෂාවේ නාම පද නිවැරැදි ව භාවිත කරයි. | 2.1 නාම, ඒක වචන, ද්වි වචන සහ බහු වචන වශයෙන් නිවැරැදි ව වර්ග කරයි. | 2.1 නාම පද<br>• නාම පදවල පවතින වචනත්‍රය<br>  • ඒක වචන<br>  • ද්වි වචන<br>  • බහු වචන | 2.1<br>• මාතෘ භාෂාවේ එදිනෙදා භාවිත කරන නාම පද ප්‍රකාශ කරයි.<br>• මාතෘ භාෂාවේ එදිනෙදා භාවිත කරන නාම පද සංස්කෘත භාෂාවෙන් ප්‍රකාශ කරයි. | 25 |

# 2 ශ්‍රේණිය විෂය නිර්දේශය සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | | • මාතෘ භාෂාවේ ඇති නාම පද ඒක වචන සහ බහු වචන වශයෙන් වර්ග කිරීමත්, සංස්කෘත භාෂාවේ පවතින වචනත්‍රයත් සංසන්දනය කරයි.<br>• වචනත්‍රයට අනුව එදිනෙදා භාවිත කරන සංස්කෘත වචන වර්ග කර දක්වයි. | |
| | 2.2 ලිංග භේදයට අනුකූල ව වචන වර්ග කරයි. | 2.2 ලිඞ්ග භේදය<br>• පුරුෂ, ස්ත්‍රී, නපුංසක | 2.2<br>• එදිනෙදා භාවිත කරන සංස්කෘත වචන පුරුෂ ලිඞ්ග, ස්ත්‍රී ලිඞ්ග සහ නපුංසක ලිඞ්ග වශයෙන් පෙළගස්වයි. | |
| | 2.3 නාමවල ශබ්ද මූලය වෙන් කරයි. | 2.3 නාමයක ශබ්ද මූලය | 2.3<br>• දෙනු ලබන නාම පදයක ශබ්ද මූලය වෙන්කර දක්වයි. | |
| | 2.4 නාමයක් ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවලට අනුව වරනගයි. | 2.4 විභක්ති<br>• ප්‍රථමා සහ ද්විතීයා<br>• අකාරාන්ත පුරුෂ ලිඞ්ග සහ නපුංසක ලිඞ්ග ශබ්ද<br>• ආකාරාන්ත ස්ත්‍රී ලිඞ්ග ශබ්ද | 2.4<br>• එදිනෙදා භාවිත කරන අකාරාන්ත පුරුෂ ලිඞ්ග සහ නපුංසක ලිඞ්ග නාම, ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවල වරනගයි.<br>• එදිනෙදා භාවිත කරන ආකාරාන්ත ස්ත්‍රී ලිංග නාම, ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවල වරනගයි. | |
| | 2.5 පුරුෂ භේදයට අනුකූල ව වචන වර්ග කරයි. | 2.5 පුරුෂ භේදය<br>• ප්‍රථම පුරුෂ<br>• මධ්‍යම පුරුෂ<br>• උත්තම පුරුෂ | 2.5<br>• එදිනෙදා භාවිත කරන ක්‍රියාපද ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ, උත්තම පුරුෂ වශයෙන් වාචික ව පෙළ ගස්වයි. | |

# 2 ශ්‍රේණිය විෂය නිර්දේශය සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.6 අව්‍යය පද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි, ලියයි. | 2.6 අව්‍යය<br>• නිපාත<br>• උපසර්ග | 2.6<br>• සංස්කෘත භාෂාවේ අව්‍යයපද වර්ග දෙකක් ඇති බව ප්‍රකාශ කරයි.<br>• අව්‍යයපද වර්ග දෙක නම් කරයි.<br>• දෙනු ලබන ඡේදයක නිපාත සහ උපසර්ග ලෙස අව්‍යයපද වෙන් කර දක්වයි. | |
| 3.0 සංස්කෘත භාෂාවේ ආඛ්‍යාත පද (අවසාන ක්‍රියා පද) නිවැරැදි ව භාවිත කරයි. | 3.1 ආඛ්‍යාතවල ධාතු මූලය වෙන් කරයි. | 3.1 ආඛ්‍යාත පදයක (අවසාන ක්‍රියා පදයක) ධාතු මූලය | 3.1<br>• දෙනු ලබන ආඛ්‍යාත පදයක (අවසාන ක්‍රියා පදයක) ධාතු මූලය වෙන් කර දක්වයි. | 30 |
| | 3.2 ලට් සහ ලඞ් ලකාරවල පරස්මෛපද නිවැරැදි ව භාවිත කරයි. | 3.2 ලට් සහ ලඞ් පරස්මෛපද ප්‍රත්‍යය සහිත ක්‍රියා පද<br>• ලට් සහ ලඞ් පරස්මෛපද ප්‍රත්‍ය ධාතු සමග යෙදීම | 3.2<br>• දෙනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතවල ඇති ලට් සහ ලඞ් පරස්මෛපද ප්‍රත්‍ය වෙන් කර පෙන්වයි.<br>• දෙනු ලබන වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු ලට්, ලඞ් ආඛ්‍යාත පද යෝජනා කරයි. | |
| 4.0 සංස්කෘත භාෂාවේ සන්ධි නිවැරැදි ව භාවිත කරයි. | 4.1 සන්ධි සහිත වචන අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි, ලියයි. | 4.1 සන්ධි<br>• ස්වර සන්ධි<br>• ව්‍යඤ්ජන සන්ධි<br>• අනුස්වාර සන්ධි<br>• විසර්ග සන්ධි<br>• ප්‍රකෘති සන්ධි | 4.1<br>• සන්ධි වර්ග පහකින් යුතු පද ඇති බව ප්‍රකාශ කරයි.<br>• සන්ධි වර්ග පහ නම් කරයි.<br>• දෙනු ලබන සන්ධි සහිත පදවල ඇති සන්ධි, ස්වර සන්ධි, ව්‍යඤ්ජන සන්ධි, අනුස්වාර සන්ධි, විසර්ග සන්ධි සහ ප්‍රකෘති සන්ධි ලෙස වර්ග කරයි. | 10 |

# 2 ශ්‍රේණිය විෂය නිර්දේශය සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 සංස්කෘත භාෂාව නිවැරැදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍ය නිර්මාණය කරයි. | 5.1 උක්තය සහ ආඛ්‍යාතය පමණක් ඇති සරල වාක්‍ය ගොඩනගයි. | 5.1 උක්තය සහ ආඛ්‍යාතය පමණක් ඇති සරල වාක්‍ය<br>• උක්තය (නාමපදය) සහ ආඛ්‍යාතය (අවසාන ක්‍රියාව) | 5.1<br>• උක්තය සහ ආඛ්‍යාතය පමණක් ඇති සරල වාක්‍ය ලියයි. | 30 |
| | 5.2 පුරුෂ භේදය සහ වචන භේදය සැලැකිල්ලට ගනිමින් සරල වාක්‍ය ගොඩනගයි. | 5.2 පුරුෂ භේදය සහ වචන භේදය<br>• ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ, උත්තම පුරුෂ<br>• ඒක වචන, ද්වි වචන, බහු වචන<br>* 'සංස්කෘත බාලාදර්ශයේ' 1 සිට 15 දක්වා පාඩම් යොදා ගනිමින් ඉහත විෂය කොටස් ආවරණය කිරීම අපේක්ෂා කෙරේ. | 5.2<br>• ලියනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතය ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ සහ උත්තම පුරුෂ ලෙස වෙන් කරයි.<br>• ප්‍රථම පුරුෂ හෝ මධ්‍යම පුරුෂ හෝ උත්තම පුරුෂ හෝ ආඛ්‍යාතය සහිත නිවැරැදි සරල වාක්‍ය ගොඩනගයි.<br>• දෙනු ලබන වාක්‍යවල ආඛ්‍යාතය ඒක වචන, ද්වි වචන, බහු වචන වශයෙන් ලෙස වර්ග කර දක්වයි.<br>• ඒක වචන, ද්වි වචන, බහු වචන ආඛ්‍යාතය සහිත සරල වාක්‍ය ලියයි. | |
| 6.0 නිර්දිෂ්ට ග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි. | 6.1 නිර්දිෂ්ට ග්‍රන්ථවල ශ්ලෝක නිවැරැදි ව හා අර්ථාවබෝධයෙන් යුතු ව භාවිත කරයි. | 6.1 නාමාෂ්ටශතකය<br>• නාමාෂ්ටශතකයේ ඇති ශ්ලෝක 18 (වණපොත් කිරීම අපේක්ෂා කෙරේ.) | 6.1<br>• නාමාෂ්ටශතකයේ ඇති ශ්ලෝක 18 ලයාන්විත ව සහ නිවැරැදි උච්චාරණයෙන් යුතු ව කටපාඩමින් කියයි.<br>• නාමාෂ්ටශතකයේ ඇති ශ්ලෝක 18 දේවනාගරී අක්ෂරවලින් ලියයි. | 60 |

# 2 ශ්‍රේණිය විෂය නිර්දේශය සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | 6.2 ව්‍යාසකාරය<br>• ව්‍යාසකාරයේ 1 සිට 30 දක්වා ශ්ලෝක | 6.2<br>• ව්‍යාසකාරයේ 1 සිට 30 දක්වා ශ්ලෝක ළයාන්විත ව සහ නිවැරැදි උච්චාරණයෙන් යුතු ව කටපාඩමින් කියයි.<br>• ව්‍යාසකාරයේ 1 සිට 30 දක්වා ශ්ලෝකවල අර්ථය ප්‍රකාශ කරයි.<br>• ව්‍යාසකාරයේ 1 සිට 30 දක්වා ශ්ලෝක දේවනාගරී අක්ෂරවලින් ලියයි. | |
| | | 6.3 සංස්කෘත වරනැගිල්ල<br>• ඉකාරාන්ත පුරුෂ ලිංග කවි ශබ්දය<br>• උකාරාන්ත පුරුෂ ලිංග සාධු ශබ්දය<br>• අකාරාන්ත නපුංසක ලිංග පුෂ්ප ශබ්දය<br>• ඍකාරාන්ත පුරුෂ ලිංග පිතෘ ශබ්දය<br>• ආකාරාන්ත ස්ත්‍රී ලිංග වනිතා ශබ්දය | 6.3<br>• කවි, සාධු, පුෂ්ප, පිතෘ සහ වනිතා යන ශබ්ද වාචෝද්ගත ව වරනගයි.<br>• කවි, සාධු, පුෂ්ප, පිතෘ සහ වනිතා යන ශබ්ද හා සමාන අන්ත ඇති අනෙකුත් නාම වරනැගීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | |
| | | 6.4 සංස්කෘත පාඨමාලා 2 | 6.4<br>• සංස්කෘත පාඨමාලා 2 අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>• නම් කරනු ලබන ව්‍යාකරණාංග සංස්කෘත පාඨමාලා 2 හි ඇතුළත් පාඩම්වලින් උපුටා දක්වයි. | |

# නිර්දිෂ්ට ග්‍රන්ථ හා පරිශීලනීය ග්‍රන්ථ (2 ශ්‍රේණිය)

## 1. නිර්දිෂ්ට ග්‍රන්ථ

- සංස්කෘත භාෂාව - 02 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- නාමාෂ්ටශතකය - පූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රේය මහ නාහිමි, මොඩන් පොත් සමාගම, නුගේගොඩ, 2005
- සංස්කෘත බාලාදර්ශය 01 - 15 පාඩම්, විද්‍යාසාගර කේ. එල්. වී. ශාස්ත්‍රී, ආර්. එස්. වෛද්‍යාර් සහ පුත්‍රයෝ, ඉන්දියාව, 2007
- ව්‍යාසකාරය ( 1 - 30 වැනි ශ්ලෝකය දක්වා )
- සංස්කෘත පාඨමාලා - 02, පූජ්‍ය බෝදාවල පියභාරති හිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන, 2016
- සංස්කෘත භාෂාව අකුරු ලියමු - (01) ප්‍රාචී අධ්‍යාපන ප්‍රකාශන.

## 2. පරිශීලනීය ග්‍රන්ථ

- භාෂණ සංස්කෘතම් - පූජ්‍ය උඩවෙල රේවත හිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන, 2010
- සරල සංස්කෘත ශික්ෂකය - 01, බලන්ගොඩ ආනන්ද මෛත්‍රේය මහ නාහිමි, මොඩන් පොත් සමාගම, නුගේගොඩ, 2012
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී ( කාරක - සමාස - තද්ධිත - තරඞ්ග), පූජ්‍ය හැගොඩ ධම්මින්ද නාහිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන, 2016

# संस्कृतपाठ्यक्रमः

සංස්කෘත විෂය නිර්දේශය

## 3 ශ්‍රේණිය

अवचिनोति च शास्त्रार्थं आचारे स्थापयत्यपि ।
स्वयमप्याचरेद्यस्तु स आचार्य इति स्मृतः ॥

යමෙක් ශාස්ත්‍ර අර්ථයෙන් දැනුම රැස් කරන්නේ ද, අන්‍යයන් ආචාර ධර්මයෙහි පිහිටුවන්නේ ද,
එ සේ ම තමනුත් එම ආචාරයෙහි හැසිරෙන්නේ ද, හෙතෙම 'ආචාර්ය' යැයි දන්නාලදී.

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **1.0 දේවනාගරී අක්ෂර මාලාව නිවැරැදි ව භාවිත කරයි.** | 1.1 දේවනාගරී අක්ෂරමාලාවේ ස්වර ප්‍රභේද සහ ව්‍යඤ්ජන ප්‍රභේද භාවිත කරයි. | 1.1 ස්වර ප්‍රභේද සහ ව්‍යඤ්ජන ප්‍රභේද<br>• ප්‍රභේද අටකින් යුත් ස්වරාක්ෂර<br>• හ්‍රස්ව<br>• දීර්ඝ<br>• ප්ලුත<br>• සමානාක්ෂර<br>• සන්ධ්‍යක්ෂර<br>• සවර්ණ<br>• නාමින්<br>• අනාමින් | 1.1<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර ප්‍රභේද අටක් ඇති බව ප්‍රකාශ කරයි.<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර ප්‍රභේද අට නිදසුන් සහිත ව පහදයි.<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර එහි ප්‍රභේද අටට වෙන් කර ලියයි.<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර ප්‍රභේද අටට අයත් වචන කියවයි, ලියයි. | 15 |
| | | • ප්‍රභේද දහ හතරකින් යුත් ව්‍යඤ්ජනාක්ෂර<br>• අන්තඃස්ථ<br>• ඌෂ්මන්<br>• අනුස්වාර<br>• විසර්ග<br>• වර්ගමූල<br>• වර්ගාන්ත<br>• අනුනාසික<br>• අල්පප්‍රාණ<br>• මහාප්‍රාණ<br>• අඝෝෂ<br>• ඝෝෂ<br>• ගුණ<br>• වෘද්ධි | • දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර ප්‍රභේද දහ හතරක් ඇති බව ප්‍රකාශ කරයි.<br>• දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර එහි ප්‍රභේද දහ හතරට වෙන් කර ලියයි.<br>• දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර ප්‍රභේද දහ හතරට අයත් වචන කියවයි, ලියයි. | |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය  සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.2 දේවනාගරී අක්ෂරමාලාවේ උත්පත්තිස්ථාන පෙන්වා දෙයි. | 1.2<br>• **අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ** .......... යනාදි පාඨය | 1.2<br>• **අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ** .......... යනාදි පාඨය කටපාඩමින් ප්‍රකාශ කරයි, ලියයි.<br>• අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ .... යනාදි පාඨයේ ඇති පරිදි අක්ෂරවල උත්පත්ති ස්ථාන යටින් ඉරි ඇඳ වෙන් කර පෙන්වයි.<br>• සංස්කෘත භාෂාවෙන් දැක්වෙන අක්ෂරවල උත්පත්ති ස්ථාන සිංහලෙන් හඳුන්වා දෙයි. | |
| **2.0 සංස්කෘත භාෂාවේ නාමපද නිවැරැදි ව භාවිත කරයි.** | 2.1 සර්ව නාම නිවැරැදි ව භාවිත කරයි. | 2.1.1 සර්ව නාම<br>• සර්ව නාම සරල ව හැඳින්වීම<br>• සර්ව නාම යෙදෙන අවස්ථා<br>• සර්ව නාම, විශේෂණ නාම ලෙස යෙදෙන අයුරු<br>• නාම පද වෙනුවට සර්වනාම යෝජනය | 2.1.1<br>• සර්ව නාම යනු මොනවා ද යි නිදසුන් සහිත ව පහදයි.<br>• මාතෘ භාෂාවේ එදිනෙදා භාවිත කරන සර්වනාම ප්‍රකාශ කරයි.<br>• මාතෘ භාෂාවේ එදිනෙදා භාවිත කරන සර්ව නාම සංස්කෘත භාෂාවෙන් ප්‍රකාශ කරයි.<br>• එදිනෙදා ජීවිතයේ දී සර්ව නාම යෙදෙන ආකාරය නිදසුන් සහිත ව ප්‍රකාශ කරයි.<br>• විශේෂණ පද වශයෙන් සර්ව නාම යෙදෙන අවස්ථා ගෙනහැර පායි.<br>• නාම පද වෙනුවට සර්වනාම යෝජනය කරමින් වාක්‍ය නිර්මාණය කරයි. | 15 |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | 2.1.2 පුරුෂ ලිඞ්ග, ස්ත්‍රී ලිඞ්ග සහ නපුංසක ලිඞ්ග සර්ව නාම<br>• සර්ව නාම ශබ්ද වරනැගීම<br>• අස්මද් ශබ්දය<br>• යුෂ්මද් ශබ්දය<br>• තද් ශබ්දය | 2.1.2<br>• වාක්‍යවල ඇති ලිඞ්ගත්‍රයට අයත් නාම පද වෙනුවට සුදුසු සර්වනාම පද යොදයි.<br>• අදාළ ශබ්ද සැලැකිල්ලට ගනිමින් දෙනු ලබන සර්ව නාම පද පුරුෂ ලිඞ්ග, ස්ත්‍රී ලිඞ්ග සහ නපුංසක ලිඞ්ග වශයෙන් වර්ග කරයි.<br>• අදාළ ශබ්ද සැලැකිල්ලට ගනිමින් දෙනු ලබන පුරුෂ ලිඞ්ග, ස්ත්‍රී ලිඞ්ග සහ නපුංසක ලිඞ්ග සර්ව නාම පද වරනගයි. | |
| 3.0 සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතපද (අවසාන ක්‍රියා පද) නිවැරැදි ව භාවිත කරයි. | 3.1 ආඛ්‍යාතවල ධාතු මූලය වෙන් කරයි. | 3.1 ආඛ්‍යාත පදයක (අවසාන ක්‍රියා පදයක) ධාතු මූලය | 3.1<br>• දෙනු ලබන ආඛ්‍යාතපදයක (අවසාන ක්‍රියාපදයක) ධාතු මූලය ඉස්මතුකර පෙන්වයි. | 15 |
| | 3.2 ලට්, ලඞ් හා ලෝට් යන ලකාර, උභයපදයෙහි සහ පුරුෂත්‍රයෙහි වරනගමින් නිවැරැදි ව භාවිත කරයි. | 3.2 ලට්, ලඞ් හා ලෝට් යන ලකාර, උභය පදයෙහි වරනැගීම<br>• පරස්මෛපද ප්‍රත්‍ය<br>• ආත්මනෙපද ප්‍රත්‍ය | 3.2<br>• දෙනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතවල ඇති ලට්, ලඞ් හා ලෝට් පරස්මෛපද ප්‍රත්‍ය වෙන්කර පෙන්වයි.<br>• දෙනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතවල ඇති ලට්, ලඞ් හා ලෝට් ආත්මනෙපද ප්‍රත්‍ය වෙන්කර පෙන්වයි.<br>• දෙනු ලබන වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු ලට්, ලඞ් ලෝට් ආඛ්‍යාතපද යෝජනා කරයි.<br>• ලට්, ලඞ් ලෝට් යන ලකාර තුනෙහි උභය පදයට අදාළ ව ධාතු වරනගයි. | |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **4.0 සංස්කෘත භාෂාවේ සන්ධි නිවැරැදි ව භාවිත කරයි.** | 4.1 ස්වර සන්ධියේ යෙදීම් අවබෝධයෙන් යුතු ව භාවිත කරයි. | 4.1 ස්වර සන්ධිය<br>• ස්වර සන්ධි ප්‍රභේද<br>  • දීර්ඝ සන්ධිය<br>  • ගුණ සන්ධිය<br>  • වෘද්ධි සන්ධිය<br>  • ව්‍යස්ත සන්ධිය<br>  • ලෝප සන්ධිය<br>  • ලෝපශ් සන්ධිය<br>  • ආදේශ සන්ධිය<br>  • ආගම සන්ධිය<br>• නිර්දිෂ්ට පාඨ ඇසුරින් දෙනු ලබන ස්වර සන්ධි පද විසන්ධි කිරීම හා විසන්ධි පද සන්ධි කිරීම | 4.1<br>• ස්වර සන්ධිය සහිත වචන නම් කරයි.<br>• ස්වර සන්ධි ප්‍රභේද නම් කරයි.<br>• ස්වර සන්ධිය සහිත වචන ප්‍රභේදවලට වෙන්කර පෙන්වයි.<br>• ස්වර සන්ධි ප්‍රභේද පැහැදිලි කරයි.<br>• ස්වර සන්ධි ප්‍රභේදවලට නිදසුන් ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට ග්‍රන්ථවල පාඨවලින් ස්වර සන්ධිය සහිත පද උපුටා දක්වයි.<br>• ස්වර සන්ධි පද විසන්ධිකර සන්ධිය සෑදී ඇති ආකාරය මතුකර පෙන්වයි. | 10 |
| **5.0 සංස්කෘත භාෂාවේ සමාස නිවැරැදි ව භාවිත කරයි.** | 5.1 සමාස පද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි, ලියයි. | 5.1.1 සමාස නාමික ව හඳුන්වා දීම | 5.1.1<br>• වෙන් වෙන් ව පවත්නා නාම පද දෙකක් හෝ වැඩි ගණනක් එකතු කොට එක් නාම පදයක් වන ලෙස ගැළැපීමෙන් සමාස නිර්මාණය වන බව ප්‍රකාශ කරයි.<br>• පහත දැක්වෙන සමාස නිදසුන් වශයෙන් දක්වයි.<br>වාචං වාචං ප්‍රති = ප්‍රතිවාචං<br>චීවරාය වස්ත්‍රම් = චීවරවස්ත්‍රම්<br>(සරල හා නිතර භාවිත වන නිදසුන් පමණක් දැක්වීම සෑහේ.) | 10 |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
